


# බුදු සිරිතේ පළමු වසර

අපේ පංතියේ බුද්ධ ධර්මය විෂයය උගන්වන්නේ ධම්මිකා ගුරුතුමියයි. පාඩම ඇරැඹීමට පෙර ළමුන් සමග සුහද ව වචන කිහිපයක් කතා කිරීම ඇගේ සිරිතයි. එක් දිනක් එලෙස පාඩම අරඹද්දී සුලෝචනා ප්‍රශ්නයක් ඇසුවා ය. "ගුරුතුමියනි, අපි පොහොය දවසේ අත්තම්මාගේ ගෙදර ගියා. අත්තම්මා අපිව ළඟ පන්සලට එකතුකරගෙන ගියා. ගිහින් බෝධීන් වහන්සේට වඳිනකොට අපි නොකියන ගාථාවක් කියා අත්තම්මා වැන්දා. මම ඒ ගාථාව මොකක් ද කියලා ඇහුවා ම සත්සති වන්දනා ගාථාව බව කියාදුන්නා. ඒ ගාථාව මම කියන්න ද" යි ඇය ඇසූ විට, ගුරුතුමිය සුලෝචනා ඉදිරියට කැඳවා පන්තියට ම ඇසෙන සේ එම ගාථාව කියන්නැයි පැවසුවා ය. ඇය ගායනා කළ ගාථාව මෙයයි:

පඨමං බෝධි පල්ලංකං - දුතියං ච අනිම්මිසං
තතියං චංකමණං සෙට්ඨං - චතුත්ථං රතනාඝරං
පංචමං අජපාලංච - මුචලින්දේන ඡට්ඨමං
සත්තමං රාජායතනං - වන්දේතං මුනි සේවිතං

මෙම ගාථාව අසා සිටි ගුරුතුමිය බොහොම හොඳයි කියා අගය කළා ය. "එහෙනම් අද මම මේ ගාථාවෙන් කියවෙන්නේ මොකක් ද කියලා පහදා දෙන්නම්" කියා බුදුරජාණන් වහන්සේ සත්සතිය ගත කළ ආකාරයත් ඉන් පසු සිදුවීම් ආදියත් පිළිබඳ ඉතා දීර්ඝ විස්තරයක් කළා ය; සත් සතිය හා සත් සතියේ සිදුවීම් වගුවකට ද ඇතුළත් කොට දක්වූවා ය; එම වගුව හා විස්තරය ලිපියක් ලෙස සකස් කරගෙන එන ලෙස සුලෝචනාට ම පැවරුවා ය. ඇය පිළියෙල කළ එම වගුව හා පසු සිදුවීම් මෙසේ ය.

අප බෝධිසත්ත්වයන් වහන්සේ වෙසක් පුර පසළොස්වක පොහෝ දින සම්මා සම්බුද්ධත්වයට පත්වූ සේක. ඉන් පසු සති හතක් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ඇසුරු කරමින් ගත කළ සේක. එම සත් සතිය තුළ වැඩ සිටි ස්ථාන හා එම කාලය තුළ සිදු වූ අසිරිමත් සිදුවීම් මෙසේ දැක්විය හැකි ය.

| සතිය | වැඩ සිටි ස්ථානය | සිදු වූ වැදගත් කාරණා |
|---|---|---|
| පළමු වන සතිය | ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ මුල | මෙම සතියේ දී පටිච්ච සමුප්පාදය අනුලෝම පටිලෝම වශයෙන් හා පටිලෝම අනුලෝම වශයෙන් මෙනෙහි කිරීම.<br>දෙවියන්ගේ සැක දුරු කිරීම පිණිස යමක මහා ප්‍රාතිහාර්යය පෑම. |
| දෙවන සතිය | ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට ඊසාන දිගින් | අනිමිස ලෝචන පූජාව පැවැත්වීම හෙවත් සතියක් ඇස්පිය නොහෙළා බෝධීන් වහන්සේ දෙස බලා සිටීම. |
| තෙවන සතිය | බෝධි මූලය හා අනිමිස ලෝචන පූජාව කළ ස්ථානය අතර | සක්මන් කිරීම (රුවන් සක්මන) |
| සිව් වන සතිය | බෝධීන් වහන්සේට වයඹ දිගින් රුවන්ගෙහි | අභිධර්මය මෙනෙහි කිරීම. මෙහි දී බුද්ධ ශරීරයෙන් බුදුරැස් විහිදෙන්නට පටන් ගත්තේ ය. |
| පස් වන සතිය | අජපාල නුගරුක මුල | හුහුංක ජාතික බමුණකු පැමිණීම සහ ඔහුට සැබෑ බමුණකුගේ ලක්ෂණ කියා දීම.<br>මාර දිව්‍ය පුත්‍රයාගේ පැමිණීම.<br>තණ්හා, අරතී, රගා යන මාර දූවරුන් පැමිණීම.<br>තමන් වහන්සේට ගුරුවරයකු නොමැති නිසා ධර්මය ගුරු තන්හි තබා ගැනීමට තීරණය කිරීම. |
| හය වන සතිය | මිදෙල්ල ගස මුල | මහා සුළඟක් සමග වර්ෂාවක් ඇතිවීම හා එම වර්ෂාවෙන් බුදුරදුන් ආරක්ෂා කිරීමට මුචලින්ද නා රජු ඉදිරිපත් වීම. |
| සත් වන සතිය | කිරිපලු රුක මුල (රාජායතනය) | සමාපත්ති සුවයෙන් වැඩ සිටීම. |

ඉහත සඳහන් පරිදි සත් සතිය ගත කළ බුදුරජාණන් වහන්සේ මුව ධෝවනය කර කිරිපලු රුක මුල වැඩ සිටි අතර තපස්සු භල්ලුක නම් වෙළෙඳ දෙබෑයෝ පැමිණ අත්සුණු හා මීපිඬු පූජා කළහ. ඔවුන්ට පූජා පැවැත්වීමට සුදුසු පූජනීය වස්තුවක් ඉල්ලූ විට බුදුරජාණන් වහන්සේ කේශ ධාතු ස්වල්පයක් දුන් සේක. බුදුන් හා දහම් සරණ ගිය පළමු (ද්වේවාචික) උපාසකවරුන් ලෙස හැඳින්වෙන්නේ ද මේ තපස්සු භල්ලුක දෙදෙනායි.



ඉක්බිති බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි සහම්පතී මහා බ්‍රහ්මයා ලෝකයාට ධර්මය දේශනා කරන ලෙස ආරාධනා කළේ ය. ඒ අනුව පළමු ධර්ම දේශනය කළ යුත්තේ කවරෙකුට ද යි කියා විමසා බැලීමේ දී ආලාර කාලාම හා උද්දකරාමපුත්ත සිහිපත් වුණි. එහෙත් ඒ වන විට ඔවුන් මියගොස් තිබුණි. එනිසා තමන් වහන්සේ දුෂ්කර ක්‍රියා කරන කාලයේ උපස්ථාන කළ පස්වග තවුසන්ට දහම් දෙසීමට සිතා බරණැස ඉසිපතනය කරා වැඩම කිරීමට පිටත් වූහ. මේ වඩින අතරමග දී උපක නම් ආජීවකයා හමුවිය. ඔහු බුදුරජාණන් වහන්සේගෙන් "ඔබේ ශාස්තෘවරයා කවරෙක් ද? ඔබ රුචි කරන ධර්මය කුමක් ද?" යි විමසී ය. "සියලු දුක් ඉක්මවා ගිය, සියල්ල අවබෝධ කළ, සියල්ලේ නොඇලුණ, නිවන් පසක් කළ මම, මගේ ආචාර්යවරයා ලෙස,

කවරකු දක්වන්නෙම් ද? මට ගුරුවරයකු නැත. සමානයකු ද නැත. මම රහත් වෙමි. නිරුත්තර වූ ශාස්තෘවරයා වෙමි. සම්මා සම්බුදු වෙමි. දම්සක් පැවැත්වීමට කසීරට බරණැස් නුවරට යමි,"යි බුදුරජාණන් වහන්සේ පිළිතුරු දුන්හ. ඉන් පසු උපක තෙමේ "ඔබ අනන්ත ජිනද?"යි බුදුරදුන්ගෙන් විමසී ය. සියලු කෙලෙස් පරදවා නිවන් පසක් කළ තමා ජින යැයි හැඳින්විය හැකි බවට බුදුරදුන්ගෙන් උපකට පිළිතුරු ලැබිණ. උපක "එය එසේත් විය හැකියැ,"යි හිස සලා පිටත් විය.

බරණැස ඉසිපතනයට වැඩම කළ බුදුරජාණන් වහන්සේ කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම, අස්සජි යන පස්වග තවුසන්ට දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කළහ. ඒ ඇසළ පුර පසළොස්වක පොහෝ දිනකයි. එම දේශනාව අසා පළමු ව කොණ්ඩඤ්ඤ තාපසතුමා ද පසු ව අනෙක් සිව් දෙනා ද සෝවන් වූ අතර බුදුරජාණන් වහන්සේ ඔවුන් **ඒහි භික්ඛු** භාවයෙන් පැවිදි කළ සේක. පසු ව දේශනා කළ **අනත්ත ලක්ඛන** සූත්‍ර දේශනාව අසා උන් වහන්සේලා රහත් වූහ.

බරණැස් සිටුතුමා මහා ධනවතෙකි; සුඛෝපභෝගී ජීවිතයක් ගෙවූ කෙනෙකි. එතුමාට යස නම් තරුණ පුතෙක් සිටියේ ය. හෙතෙම සැප සම්පත් පිළිබඳ කළකිරී ජීවිතයේ සැනසිල්ල සොයමින් දිනක් උදෑසන නිවසින් පිටත් විය. බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි ඔහුට උන් වහන්සේ විසින් ධර්මය දේශනා කරන ලදි. හෙතෙම සෝවන් විය. නිවසෙහි නොසිටි තම පුතු සොයමින් යස කුල පුත්‍රයාගේ පියා පැමිණියේ ද බුදුරදුන් වෙතයි. බුදුරජාණන් වහන්සේ බරණැස් සිටුතුමාට පුතු නොපෙනීමට අධිෂ්ඨාන කළහ. පසු ව පියාට ධර්මය දේශනා කළ සේක. හෙතෙම තෙරුවන ම සරණ ගිය පළමු උපාසකයා බවට පත්විය. ධර්ම දේශනාව අවසානයේ පියා සෝවන් වූ අතර ඒ අසල සිටි යස කුල පුත්‍රයා ද රහත් ඵලයට පත්විය. ඉන් පසු බුදුරජාණන් වහන්සේ යස කුල පුත්‍රයා පෙනී සිටීමට සලස්වා ඒහි භික්ඛු භාවයෙන් පැවිදි කළ සේක. බරණැස් සිටුතුමා තම පුතුට හා බුදුරජාණන් වහන්සේට දහවල් දානය සඳහා ආරාධනා කොට පිටත් විය.

දහවල් දානය සඳහා යස මහරහතන් වහන්සේ ද සමග බුදුරජාණන් වහන්සේ සිටු නිවසට වැඩම කළ සේක. බුදුරජාණන් වහන්සේ ඔහුගේ ගිහි කල බිරියටත්, මවටත් ධර්මය දේශනා කළ සේක. එම දේශනාව අසා මව වූ සුජාතාව හා බිරිය තෙරුවන් සරණ ගියහ; එසේ ම සෝවන් ඵලයෙහි ද පිහිටියහ. මේ නිසා තෙරුවන් සරණ ගිය පළමු උපාසිකාවන් වීමේ ගෞරවය ද ඔවුන්ට හිමි වෙයි.

යස කුල පුත් පැවිදි වීමේ ආරංචිය අසා ඔහුගේ හොඳ ම මිතුරන් වූ විමල, සුබාහු, පුණ්ණජි, ගවම්පති යන සතර දෙනා ද එහි පැමිණියහ. ඔවුහු ද බණ අසා සෝවාන් වූ අතර ඒහි භික්ඛු භාවයෙන් පැවිදි උපසම්පදාව ද ලබාගත්හ. පසු ව තවත් යහළුවන් පනස්දෙනෙක් ද පැමිණ බණ අසා රහත් වීම හා පැවිදි වීම විශේෂත්වයකි. මේ වන විට බරණැස ඉසිපතනාරාමයේ වැඩසිටි රහත් භික්ෂූන් වහන්සේලාගේ පිරිස හැට නමකි. බුදුරජාණන් වහන්සේ වැසි කාලය අවසානයේ ඉල් පුර පසළොස්වක පොහෝ දින එම ශ්‍රාවක පිරිස රැස්කොට ධර්ම චාරිකාවේ වඩින ලෙස අනුශාසනා කළ සේක. **එහි දී වැඩි දෙනකුට සේවය සලසනු වස් දෙනමක් එක මග නොවඩින ලෙසත් මුල මැද අග යහපත් වූ ධර්මය ම දේශනා කරන ලෙසත්, දෙවියන් සහිත වූ මිනිසුන්ට හිත පිණිස කටයුතු කරන ලෙසත්** අනුශාසනා කර ධර්ම දූත සේවයට පිටත් කළහ.

මෙම සිදුවීම්වලින් පසු බුදුරජාණන් වහන්සේ ද උරුවෙල් දනව්ව බලා වැඩම කළ අතර කාන්තාවක සොයමින් පැමිණි භද්දවග්ගිය කුමාරවරු බුදුරදුන් හමුවූහ. ඔවුනට ද කරුණු පැහැදිලි කොට දහම් දෙසා පැවිදි කළහ. මෙසේ බුදු සසුනේ ශ්‍රාවක පිරිස තවත් තිස් නමකින් වර්ධනය විය. පිළිවෙත් පිරූ ඔවුහු ද සෝවාන් ආදි මාර්ග ඵලවලට පත්වූහ. එම භද්දවග්ගිය භික්ෂූන් වහන්සේලාට ද ධර්ම චාරිකාවේ වඩින ලෙස අනුශාසනා කර බුදුරජාණන් වහන්සේ උරුවෙල් දනව්ව බලා වැඩම කළ සේක.

උරුවෙල් දනව්වෙහි ජටිල සහෝදරයෝ තිදෙනෙක් වාසය කළහ. උරුවේල කාශ්‍යප, නදී කාශ්‍යප, ගයා කාශ්‍යප යනු ඒ තිදෙනායි. ඔවුන්ට පිළිවෙළින් පන්සියයක, තුන්සියයක හා දෙසියයක අනුගාමී පිරිසක් සිටියහ. උරුවේල කාශ්‍යප සිය පිරිස සමග ගඟේ ඉහළ කොටසේ වාසය කළ අතර සෙසු පිරිස ගඟේ පහළ කොටසේ වාසය කළහ. මොවුහු ජටාධර තවුසෝ ය. එබැවින් ඔවුහු ජටිලයන් යනුවෙන් හඳුන්වනු ලැබෙති. ඉතා මානාධික තැනැත්තකු වූ උරුවේල කාශ්‍යපට බුදුරජාණන් වහන්සේ බොහෝ ප්‍රාතිහාර්ය දක්වා ඔහුගේ මානය නැතිකොට ඔහු ඇතුළු පිරිස පැවිදි කළහ. ඔවුහු පැවිදි වීමේ දී තම ජටා ආදිය ගලවා ගඟට දැමූහ. එවා වතුරේ පාවී එනවා දුටු අනිත් සහෝදරයෝ දෙදෙනා ද තම සහෝදරයාට කරදරයක් වී ඇද්ද යි බැලීමට ගඟ දිගේ ඉහළට ගමන් කළහ. එහි දී උරුවේල කාශ්‍යප ඇතුළු පිරිස පැවිදි වී සිටිනවා දැක ඔහුගේ බාල සොහොයුරෝ ද පිරිස් සමග පැවිදි වූහ. ඒ අනුව එකතු වූ භික්ෂූ පිරිස එක්දහස් තුනක් විය. ඔවුහු සියලු දෙනා ම ධර්මාවබෝධය ලබා ගත්හ.

දුරුතු පසළොස්වක පොහෝ දා උදාවිය. ලෝක සත්ත්වයා වෙත පතළ වූ මහා කරුණාවෙන් යුක්ත ව ලොව බලන බුදුරජාණන් වහන්සේ ලක්වැසියන්ට තමන් වහන්සේගෙන් වන ශාන්තිය දැක දුරුතු පොහෝ දින ලංකාවේ අද මහියංගණ චෛත්‍යය පිහිටි ස්ථානයට අහසින් වැඩි සේක. ඒ බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකාගමනයයි. එදා මහවැලි ගඟ අසබඩ රැස්වූ යක්ෂ ගෝත්‍රික දෙපිරිසක් සංග්‍රාමයකට සැරසුණ අවස්ථාවේ එම යුද්ධය සංසිඳුවා ධර්ම දේශනා කළ සේක. එහි දී සුමන සමන් දෙවියන් ඇතුළු පිරිස සරණ සිල්හි පිහිටවූ සේක. සෝවන් වූ සුමන සමන් දෙවියෝ පිදීමට යමක් ඉල්ලූහ. බුදුරජාණන් වහන්සේ හිස පිරිමැද කේශ ධාතු මිටක් දුන් සේක. ඒවා තැන්පත් කොට මහියංගණ චෛත්‍යය සෑදවූ බව සඳහන් වේ. බුදුරජාණන් වහන්සේ එදින ම ආපසු උරුවෙල් දනව්වට වැඩම කළහ.

ඉක්බිති ව බුදුරජාණන් වහන්සේ එක්දහස් තුනක් වූ සිය ශ්‍රාවකයන් සමග රජගහ නුවර සමීපයට වැඩම කොට ගවු තුනක් මැතින් වූ තල් වනයේ වැඩ සිටියහ. එහි දී බිම්බිසාර රජතුමා බුදුරජාණන් වහන්සේ වැඩි බව දැනගෙන විශාල පිරිසක් සමග එහි පැමිණියේ ය. බණ ඇසූ රජතුමා ඇතුළු පිරිසේ සමහරු සෝවන් වූහ. සමහරු උපාසකත්වයට පත් වූහ. සෝවන් වූ පළමු රජතුමා ලෙස බිම්බිසාර රජතුමා හැඳින්විය හැකි ය.

බිම්බිසාර රජතුමා තමා මගධයේ රජවීමත්, තම රටට බුදුරජාණන් වහන්සේ වැඩම කරවා ගැනීමත්, බුදුරජාණන් වහන්සේ ඇසුරු කිරීමත්, උන් වහන්සේගෙන් බණ ඇසීමත්, එම ධර්මය අවබෝධ කරගැනීමත් යන බලාපොරොත්තු පහක් ඇති ව සිටි බවත් ඒ පහ ම ඉටු වී ඇති බවත් පවසා පසු දා දානයට ආරාධනා කළේ ය.

දානයට වැඩම කළ බුදුරජාණන් වහන්සේට බිම්බිසාර රජු විසින් වේළුවනාරාමය පූජාකරන ලදි. එය බුදු සසුනේ පළමු ආරාම පූජාවයි. එම පූජාවෙන් අනතුරුව රජතුමාගෙන් පින් බලාපොරොත්තු වූ ඥාති ප්‍රේත පිරිසක් නිමිතිකොට ඔවුන්ට පින් අනුමෝදන් කිරීමේ වැදගත්කම පෙන්වා දෙමින් තිරෝකුඩ්ඩ සූත්‍ර දේශනාව සිදුකරන ලදි.



සංජය යනු පිරිවැජියෙකි. ඔහු සමීපයෙහි විශාල සිසු පිරිසක් සිටි බව සඳහන් වේ. එයින් කෝලිත හා උපතිස්ස පිරිවැජියන් දෙදෙනා සමග තවත් දෙසිය පනහක පිරිසක් බුදු සසුනෙහි පැවිදි වීම විශේෂ සිදුවීමකි. උපතිස්ස කෝලිත දෙදෙනා සසුන්ගත වූයේ සැරියුත් හා මුගලන් යන නම්වලිනි. මේ වන විට බුදුරජාණන් වහන්සේ හමුවෙහි භික්ෂු ශ්‍රාවක පිරිස එක්දහස් දෙසිය පනස් පස් නමක් වූහ. බුද්ධත්වයෙන් වසරකට පසු ප්‍රථම සංඝ සන්නිපාතය නම් වූ මහ සඟ සමුළුව පවත්වන ලද්දේ උන් වහන්සේලාගේ ද සහභාගිත්වයෙනි. එහි දී සැරියුත් මුගලන් මාහිමිවරුන්ට අග තනතුරු පිරිනැමීමත් ඕවාද ප්‍රාතිමෝක්ෂය දේශනා කිරීමත් සිදුවිය.

සිදුහත් කුමරු ගිහි සැප අත්හැර ගිය දා පටන් සුද්ධෝදන රජතුමා රහසිගත දූතයන් යවමින් තොරතුරු සෙවීම සිදුකළේ ය. තම පුතු බුදු පදවිය ලබා රජගහ නුවර සිටින බව දැනගෙන සිටි රජතුමා බුදුරජාණන් වහන්සේ තම රාජධානිය වූ කිඹුල්වත් පුරයට වැඩමවාගෙන එන ලෙස දන්වා ඇමැතියකු සමග දහසක රාජපුරුෂ කණ්ඩායමක් පිටත් කළේ ය. හැට යොදුනක් ගමන් කොට වේළුවනාරාමයට ළඟා වූ ඔවුහු බුදුරදුන්ගෙන් දහම් අසා රහත් ව පැවිදි බව ද ලබාගත්හ; පැමිණි කාරණය මග හැරිණ. රජතුමා තවත් දහසක කණ්ඩායමක් ඇමැතිවරයකු සමග පිටත් කළේ ය. එම පිරිස ද බණ අසා පැවිදි වූහ. මේ ආකාරයට කණ්ඩායම් නවයක් ම යැවූ නමුත් පිය රජුගේ ආරාධනාව බුදුරජාණන් වහන්සේට නොලැබිණි.

අවසානයේ දී බෝසතාණන් වහන්සේ උපන් දිනයේ ම උපන් කාළුදායි නම් ඇමැතියා කැඳවූ සුදොවුන් රජතෙමේ මේ කාර්යය ඉටු කිරීමට ඔබට පුළුවන් ද යි ඇසී ය. ඉතා දක්ෂ ඇමැතිවරයකු වූ ඔහු කලින් අයට සිදුවූ දෙය හොඳින් ම දැන සිටියේ ය. "රජතුමනි, මට පැවිදි වීමට අවසර දෙන්නේ නම් මම ඒ දේ ඉටුකරමි"යි හෙතෙම පැවසී ය. රජු පැවිදි වීමට අවසර දුන් අතර ඔහු ද දහසක පිරිසක් සමග ගොස් බණ අසා පැවිදි වී ධර්මාවබෝධය ලබාගත්තේ ය. එහෙත් තමා පැමිණි කාරණය අමතක නො කළේ ය.

මැදින් පුර පසළොස්වක පොහොය ළඟාවෙත් ම කාළුදායි රහතන් වහන්සේ තමාගේ අභිලාෂය බුදුරජාණන් වහන්සේට දැන්වීමට තීරණය කළහ. බුදුරදුන් වෙත වැඩම කළ උන් වහන්සේ රජගහනුවර සිට කිඹුල්වත් පුරට යන යොදුන් හැටක් පමණ වූ මාර්ගය පිළිබඳ ඉතා විචිත්‍ර වර්ණනාවක් ඉදිරිපත් කළහ. එය ගාථා හැටකින් යුක්ත වූවකි. මෙම මාර්ග වර්ණනාව සිදු කළ උන් වහන්සේ පිය රජු ඇතුළු ඥාතීන් බුදුරජාණන් වහන්සේගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටින බවත් ඒ සඳහා වැඩමවීමට මෙය ඉතා ම හොඳ කාලයක් බවත් පැවසූහ. කිඹුල්වත්පුර ගමනින් සිදුවන යහපත දුටු බුදුරජාණන් වහන්සේ එම ඉල්ලීම පිළිගත්හ. ඒ වන විට ශාසනයේ වැඩ සිටි රහතන් වහන්සේලා පිරිස විසි එක් දහස් තුන්සිය පනස්පස් නමකි. මේ පිරිසෙන් කිඹුල්වත් නුවරින් පැමිණ පැවිදි වූ දස දහසක් හිමිවරු ද, අංග මගධ දෙරටින් පැවිදි වූ දස දහසක් ද  වශයෙන් විසි දහසක් ස්වාමීන් වහන්සේලාට කිඹුල්වත්පුර ගමන සඳහා සූදානම් වන ලෙස දැන්වූහ. විසි දහසක් රහතන් වහන්සේලා පිරිවරාගත් බුදුරජාණන් වහන්සේ මැදින් පුර පසළොස්වක පොහෝ දා රජගහ නුවරින් පිටත් වූ අතර වෙසක් පුර පසළොස්වක පොහෝ දා කිඹුල්වත් පුරයට ළඟා වූහ.



## සාරාංශය

වෙසක් පුර පසළොස්වක පොහෝ දා බුද්ධත්වයට පත් අප බුදුපියාණන් වහන්සේ සති හතක් බෝධීන් වහන්සේ ඇසුරු කරමින් වැඩ සිටියහ. ඉන් පසු බරණැස ඉසිපතනයට වැඩමවා පස්වග තවුසන්ට දහම් දෙසීමත් ඔවුන් පැවිදි උපසම්පදා කිරීමත් සමගින් භික්ෂු සමාජය ආරම්භ විය. එසේ පස් දෙනෙකුගෙන් යුක්ත ව ඇරඹුණු බුදු සසුනේ රහතන් වහන්සේලා ප්‍රමාණය වසරක් වන විට විසි දහස ඉක්මවීම විශේෂත්වයකි. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය මෙතරම් ඉක්මනින් ප්‍රචලිත වීමෙන් පෙනී යන්නේ එදා මිනිසුන්ට තිබූ ධර්මයේ අවශ්‍යතාවයි.



## ක්‍රියාකාරකම

1. සත් සතිය වන්දනා කරන ගාථාව කට පාඩමින් කියන්න.
2. ප්‍රථම සංඝ සම්මේලනයට සහභාගි වූ රහතන් වහන්සේලා ගණන එක්දහස් දෙසිය පනස් පස් නමක් වූයේ කෙසේ ද යි පැහැදිලි කරන්න.
3. මෙම පාඩමෙහි ඇතුළත් සිද්ධිවලින් ප්‍රකට වන බුද්ධ චරිතයෙහි සුවිශේෂී ලක්ෂණ පහක් හඳුන්වා දෙමින් ඡේදයක් ලියන්න.



## පැවරුම

සත් සතියෙහි ඔබ සිත් ගත් එක් සතියක් චිත්‍රයට නගන්න.